# මාසික
# විවරණිකාව

**2010 ජනවාරි**



**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

60 වැනි වෙළුම  01 වැනි කලාපය

**2010 ජනවාරි**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01.**

# පටුන

පිටුව


1 වන කොටස - මාසික සිදුවීම් .......... .......... 05

2 වන කොටස - පුවත්පත් නිවේදන - 2010 ජනවාරි

1. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 1985න් පසු පහළම මට්ටම කරා ළඟා වෙයි ........... .......... 06
2. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා අමතර පොලී අනුපාතිකයක් ගෙවීමට හැකිවන අයුරින් මුදල් සමාගම් විසින් තැන්පතු සඳහා ගෙවිය හැකි පොලී අනුපාතිකයන් සංශෝධනය කරන ලදී ........... ........... 08
3. මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2010 ජනවාරි ........... ........... 08
4. 2009 නොවැම්බර් මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය ........... ........... 09
5. ශ්‍රී ලංකාව මැදි ආදායම්ලාභි නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයක තත්ත්වය කරා ළඟා වේ ............ ........... 11
6. "පිබිදෙන උතුර" සහ "නැගෙනහිර සංවර්ධන" ණය යෝජනා ක්‍රමයන්හි පොලී අනුපාතිකය සියයට 9 දක්වා පහත හෙලීම ........... ........... 12
7. කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (CCPI) ........... ........... 12

## 1 වන කොටස
# මාසික සිදුවීම්
## 2010 ජනවාරි

### රාජ්‍ය මූල්‍ය අංශය

- සමහර පී.වී.සී. හම් රෙදි ආනයනය සඳහා අය කළ අධිභාරය ඉවත් කරන ලදී.
- පෙට්‍රල් සහ ඩීසල් සම්පූර්ණ ආනයන තීරු බදු අත්හැරීමක් ලබාදෙන ලදී.
- බඩ ඉරිඟු ආනයනය සඳහා සියයට 2.5 ක තීරු බදු අත්හැරීමක් ලබාදෙන ලදී.
- එල්.පී.ගෑස් සඳහා වූ නිෂ්පාදන බද්ද සියයට 5 හෝ කිලෝ ග්‍රෑමයට රුපියල් 31.50 සිට සියයට 5 හෝ කිලෝ ග්‍රෑමයට රුපියල් 8.70 යන දෙකෙන් ඉහළ අගය අයකර ගැනීමට හැකිවන පරිදි අඩු කරන ලදී.
- 2009 නොවැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි රජයේ සේවකයන්ගේ සහ රජයේ විශ්‍රාමිකයන්ගේ ජීවන වියදම් දීමනාව පිළිවෙලින් මසකට රුපියල් 4,500 සිට රුපියල් 5,000 දක්වා ද (රුපියල් 750 කින්) මසකට රුපියල් 2,000 සිට රුපියල් 2,375 දක්වා ද (රුපියල් 375) කින් වැඩි කරන ලදී.
- 2009 නොවැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි රජයේ දෛනික වැටුප් ලබන සේවකයන්ගේ ජීවන වියදම් දීමනාව වැඩ කරන දිනකට රුපියල් 150 සිට රුපියල් 175 දක්වා (රුපියල් 25 කින්) වැඩි කරන ලදී.

### ඔස්ට්‍රියා යුනික්‍රෙඩිට් බැංකුවෙන් ලද ණය

පැරණි ලක්ෂපාන විදුලි බලාගාරය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 ජනවාරි 7 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ඔස්ට්‍රියා යුනික්‍රෙඩිට් බැංකුව අතර යූරෝ මිලියන 24.14 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 3.98 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව යුරෝපා අන්තර් බැංකු අර්පණ අනුපාතය (EURIBOR) මත 2.1% ක ආන්තික පොලියක් සහිත පොලී අනුපාතිකයක් ද, සියයට 0.4 ක අනිවාර්ය ගෙවීමක්ද, ණය පහසුකම මත සියයට 0.6 ක කලමනාකරණ ගෙවීමක්ද, යූරෝ 2,521,295 ක (ණය පහසුකමෙන් සියයට 11.5 ක) ඇප මුදලක් ද මේ සඳහා අදාළ වේ. වසර 3 ක සහන කාලයකට යටත්ව වසර 10 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

### ජාත්‍යන්තර සංවර්ධන සංවිධානයෙන් ලැබුණු ණය

2010 ජනවාරි මස 11 වැනි දින ශ්‍රී ලංකා රජය හා ජාත්‍යන්තර සංවර්ධන සංවිධානය අතර අත්සන් කරන ලද ගිවිසුම් 3 හි කොන්දේසි පහත පරිදි වේ.

(1) ප්‍රාදේශීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා වි.ගැ.හි. මිලියන 66.1 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 11.89 ක) ණය මුදල.

(2) උතුරු පළාත් ප්‍රතිසංස්කරණය කිරීමේ කඩිනම් ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා වි.ගැ.හි. මිලියන 40.9 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 7.36 ක) ණය මුදල.

(3) යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශයන්හි ජන ජීවිතය නඟා සිටුවීමේ ව්‍යාපෘතිය සඳහා අමතර අරමුදල් සම්පාදනය වශයෙන් වි.ගැ.හි. මිලියන 7.6 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.37 ක) ණය මුදල.

මෙම ණය මුදල් සඳහා ප්‍රයෝජනයට ගන්නා ලද ශේෂය මත සියයට 0.75 ක සේවා ගාස්තුවක් ද ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.5 ක අනිවාර්යය ගෙවීමක්ද අදාල වේ. වසර 10 ක සහන කාලයකට යටත්ව වසර 20 ක් තුළදී මෙම ණය මුදල් ගෙවා නිම කළ යුතුය.

### ඉරාන අපනයන සංවර්ධන බැංකුවෙන් ලැබුණ ණය

ග්‍රාමීය විදුලි බලය බෙදා හැරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා 2010 ජනවාරි මස 17 වැනි දින ශ්‍රී ලංකා රජය හා ඉරාන අපනයන සංවර්ධන බැංකුව අතර යූරෝ මිලියන 77.14 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 12.72 ක) ණය මුදලක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව (Commercial Interest Reference Rate) (CIRR) මත 2% ක ආන්තිකයක් සහිත පොලී අනුපාතිකයක් ද, ණය පහසුකම මත සියයට 0.25 ක කළමනාකරණ ගාස්තුවක් ද, යූරෝ 3,057,139 ක රක්ෂණ වාරිකයක් සහ ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.25 ක අනිවාර්යය ගෙවීමක් ද අදාල වේ. වසර 3 ක සහන කාලයට යටත්ව වසර 8 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

### ජපාන රජයෙන් ලැබුණු ප්‍රදාන

නැගෙනහිර පළාතේ පාලම් 5 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 ජනවාරි මස 19 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ජපාන රජය අතර ජපන් යෙන් මිලියන 29 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 36.55 ක) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

# 2 වන කොටස
# පුවත්පත් නිවේදන
## 2010 ජනවාරි

### 1. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 1985න් පසු පහළ ම මට්ටම කරා ළඟා වෙයි

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2002 = 100) මගින් මනිනු ලබන වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය, 2008 වසරේ වාර්තා වූ සියයට 22.6හි සිට 2009 වසරේ දී සියයට 3.4 දක්වා ස්ථාවර ලෙස අඩු විය. මෙය 1985 වසරෙන් පසු වාර්තා වූ පහළතම වාර්ෂික සාමාන්‍ය (වසර අග) උද්ධමන අනුපාතය වේ. ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය පසුගිය වසරේ දෙසැම්බර් මස වාර්තා වූ සියයට 14.4 සමඟ සැසඳීමේ දී 2009 දෙසැම්බර් මස සියයට 4.8 දක්වා ළඟා විය.*

පහළ උද්ධමන අනුපාතයක් පවත්වා ගැනීම බොහෝ ආර්ථික හා සමාජයීය වාසි ඇති කරයි. එමගින්, ඉතිරි කිරීම් සහ ආයෝජන දිරි ගැන්වීම, ඵලදායි නොවන ආයෝජනවල සිට ඵලදායී ආයෝජන කරා ප්‍රාග්ධන ගලා යෑම් උත්ප්‍රේරණය හා ඒ තුළින් ආර්ථික වර්ධනය වැඩි දියුණු වීම සහ සේවා නියුක්ති අවස්ථා බිහි වීම සිදු වේ. තවද, පහළ උද්ධමනය අහිතකර අපේක්ෂාවන් ඇති වීම වළකන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන ස්ථාවරතාවය ආයෝජකයන්, පාරිභෝගිකයන්, සැළසුම්කරුවන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන්හට ඵලදායී තීරණ ගැනීම සඳහා උපකාරී වේ. ස්ථාවර ආදායම් උපයන්නන්, විශ්‍රාමිකයන් සහ අඩු ආදායම් ලබන්නන් වැනි කාණ්ඩවල මූර්ත ආදායම ඉහළ උද්ධමනය මගින් විශාල වශයෙන් පහත හෙලන නමුත් අඩු උද්ධමනය එවැනි කාණ්ඩ ආරක්ෂා කරයි.


**2009 වසරේ මිල විචලනයන්**

දර්ශකයේ සියයට 3.4ක වාර්ෂික සාමාන්‍ය වෙනස සඳහා මූලික දායකත්වය ආහාර හා මධ්‍යසාර නොවන පාන අයත් උප කාණ්ඩයෙන් (සියයට 2.8) ලැබිණි. සෞඛ්‍යය, ක්‍රීඩා හා විනෝද කටයුතු, අධ්‍යාපන, ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහස්ථ නඩත්තු කටයුතු සහ රෙදිපිළි හා පාවහන් යන උප කාණ්ඩයන් ද මෙම ඉහළ යෑම කෙරෙහි දායක විය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන්, ඉන්ධන මිල සහ පොදු ප්‍රවාහන ගාස්තු අඩුවන පරිදි කරන ලද සංශෝධනයන් හේතුවෙන් ප්‍රවාහන උප කාණ්ඩය මගින් මෙම වාර්ෂික සාමාන්‍ය ඉහළ නැගීම කෙරෙහි දැක් වූ දායකත්වය 2009 දී සෘණ අගයක් ගැනිණි.

වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය, ස්ථාවරව අඩු වීම ඉල්ලුම් හා සැපයුම් යන දෙපාර්ශවයේ ම සාධකවල හිතකර වර්ධනයන්හි ප්‍රතිඵලයකි. ඉල්ලුම දෙසින් ගත් කළ, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් 2007 සහ 2008 වසරවල ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්තිය මගින් ඉහළ යන උද්ධමනය ඵලදායී ලෙස පාලනය කැරිණි. සැපයුම දෙසින් ගත් කල, දේශීය සැපයුම් තත්ත්වයන් හිතකර වීම (විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්හි) සහ ජාත්‍යන්තර වෙළෙඳපොළේ භාණ්ඩ මිල පහළ යෑම හේතුවෙන් මිල මත වූ පීඩනය අඩු විය.

මෑත කාලීනව මිල මත පීඩනයන් ඇති වුව ද, ප්‍රධාන වශයෙන් ම රජය මගින් පැන වූ මිල සීමාවන් හේතුවෙන් පසුගිය වසර සමඟ සැසඳීමේදී සහල්වල සාමාන්‍ය මිල සාපේක්ෂව පහළ මට්ටමක පැවැතිණි. කෙසේ වුව ද, අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුකොටගෙන සැපයුම හිඟ වීමෙන් සහ මහ කන්නයේ අස්වැන්න පිළිබඳව පැවැති අවිනිශ්චිත බව හේතුවෙන් ගොවීන් විසින් තොග නිදහස් කිරීම සීමා කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස වසරේ අග භාගයේ දී වී මිලෙහි ඉහළ යෑමක් වාර්තා විය.

වර්ෂයේ සමහර මාසවල දී මිල ඉහළ යෑමක් වාර්තා වූ නමුත්, පසුගිය වසර හා සැසඳීමේදී එළවළු මිල ගණන් සාපේක්ෂව පහත බැස තිබිණි. පොල් නිෂ්පාදනය ඉහළ යෑම නිසා 2008 වසර සමඟ සසඳන විට 2009 වසරේ දී පොල් හා පොල්තෙල්වල සාමාන්‍ය මිල පිළිවෙලින් සියයට 22.2කින් හා සියයට 24.0කින් පහත බැස ඇත. කෙසේ නමුත්, ප්‍රධාන වශයෙන් අර්තාපල් වගා කරන ප්‍රදේශවල පැවැති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් සැපයුම පහළ යෑම නිසා 2009



වසරේදී අර්තාපල්වල සාමාන්‍ය දේශීය මිල පෙර වර්ෂය හා සැසඳීමේදී සියයට 19.5 කින් ඉහළ නැගිණි.

සැපයුම් තත්ත්වයේ පහළ යෑම නිසා වසර මැද දී මත්ස්‍ය සහ මුහුදු ආහාරවල සැලකිය යුතු මිල වර්ධනයක් සිදු වීම හේතුවෙන් 2009 වසර තුළ දී ඒවායේ සාමාන්‍ය මිල මට්ටම සියයට 6 කින් පමණ වැඩි විය. එනමුත්, ජූලි මාසයේ දී මසුන් ඇල්ලීමේ වාරය ආරම්භ වීමත් 2009 ජූනි මාසයේ සිට උතුරු හා නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශවල මසුන් ඇල්ලීම සඳහා පැවැති සීමාවන් ලිහිල් කිරීමත් සමග මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ ගිය අතර මත්ස්‍ය මිල ගණන් සැලකිය යුතු ලෙස පහත වැටීම ආරම්භ විය.

පසුගිය වසර හා සැසඳීමේදී නිවාස, ජලය. විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන යන උප දර්ශකයේ  සියයට 0.3 ක පමණ සුළු වර්ධනයක් දක්නට ලැබිණි. එය ඉන්ධන හා ගෑස්වල මිල ගණන් අඩුවන පරිදි සංශෝධනය කිරීමත්, 2009 පෙබරවාරි 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ජල බද්ද ඉහළ නැංවීමත්, 2009 මැයි මස මුල සිට ජාතිය ගොඩ නැගීමේ බද්ද සියයට 1 සිට සියයට 3 දක්වා ඉහළ නැංවීමත් නිසා ඇති වූ සාමූහික බලපෑමකි.

ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඉන්ධන මිල පහළ යෑම මගින් සෘජුව හා වක්‍රව දේශීය මිල මත යහපත් බලපෑමක් ඇති විය. 2008 දෙසැම්බර් මස අග සිට ඉන්ධන මිල ගණන් පහත හෙළීම බොහෝ පාරිභෝගික සහ අතරමැදි භාණ්ඩවල සමස්ත පිරිවැය ව්‍යුහය කෙරෙහි සෘජු හා වක්‍ර යන දෙයාකාරයෙන්ම සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. එය මිල මට්ටම පහත හෙළීම සඳහා හේතු විය. කෙසේ වුවද, බොර තෙල් බැරලයක ආනයනික මිල 2009 ජනවාරි මස පැවති එ.ජ.ඩොලර් 41.71 සිට ජූනි මාසයේ දී එ.ජ.ඩොලර් 72.8 දක්වා ඉහළ යෑමත් සමග 2009 ජූලි මාසයේ දී පෙට්‍රල්, ඩීසල් හා භූමිතෙල් ලීටරයක මිල පිළිවෙලින් රු. 10, රු. 3 සහ රු. 1 බැගින් ඉහළ නැංවීම නිසා වසරේ ඉතිරි කාලය තුළ මිල මත සුළු උඩුකුරු පීඩනයන් ඇති විය. 2009 වසරේ දී එල් පී ගෑස් මිල සිව් වතාවක් සංශෝධනය කැරිණි. 2008 වසරේ අග භාගයේ සිට සිදු වූ මෙම මිල සංශෝධනයන් මගින් දර්ශකය මත සමස්ත වශයෙන් හිතකර බලපෑමක් ඇති විය.

කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙහි ආනයනික කාණ්ඩයේ අයිතමයන්ගේ මිලෙහි හැසිරීම් රටාව ද උද්ධමනය ක්‍රමයෙන් පහත වැටීම කෙරෙහි හේතු විය. 2008-2009 වර්ෂ අතරතුර කාලයේ දී ආනයනික භාණ්ඩ මගින් උද්ධමනය කෙරෙහි ඇති කරන ලද දායකත්වය සාමාන්‍ය වශයෙන් සියයට 38.9 සිට සෘණ සියයට 10.0 දක්වා පහත වැටුණු අතර, දේශීයව නිෂ්පාදිත භාණ්ඩ මගින් ඇති කරන ලද දායකත්වය සියයට 61.1 සිට සියයට 110.0 දක්වා වැඩි වී ඇත. ගෝලීය අවපාතය හේතුවෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළේ භාණ්ඩවල මිල ගණන් අඩු වීම සහ ගැල් කුලී අඩු වීම වර්ෂය තුළ දී ප්‍රධාන ආනයනික භාණ්ඩයන්හි මිල ගණන් පහත වැටීමට හේතු විය. ඒ අනුව තිරිඟු පිටි, කිරිපිටි සහ එළවළු තෙල්වල සාමාන්‍ය දේශීය මිල ගණන් ද පසුගිය වසරට සාපේක්ෂව අඩු විය.

ආනයනික භාණ්ඩවල ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල ගණන් පහළ මට්ටමක පැවැතීම මගින් පාරිභෝගික මිල මත ඇති වූ බලපෑම සාපේක්ෂ වශයෙන් ස්ථාවර ව පැවැති විනිමය අනුපාතය මගින් තවදුරටත් පහසු කැරිණි.  2009 දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ.ඩොලරයට සාපේක්ෂව ආන්තික වශයෙන්, සියයට 1 කින් අවප්‍රමාණ විය.

කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙන් ආහාර සහ බලශක්ති අයිතමයන් ඉවත් කර ගණනය කරනු ලබන මූලික උද්ධමනයෙහි වාර්ෂික සාමාන්‍යය 2008 පැවැති සියයට 13.6හි සිට 2009හි දී සියයට9.2 දක්වා පහත වැටී ඇත. මූලික උද්ධමනයෙහි ලක්ෂ්‍යමය අනුපාතය ද ක්‍රමිකව අඩුවන උපනතියක් අනුගමනය කරමින් 2008 වසර අග දී පැවැති සියයට 15.7 ට සාපේක්ෂව 2009 වසර අග දී සියයට 5.9 ක් කරා ළඟා විය.

## 2. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා අමතර පොලී අනුපාතිකයක් ගෙවීමට හැකි වන අයුරින් මුදල් සමාගම් විසින් තැන්පතු සඳහා ගෙවිය හැකි පොලී අනුපාතිකයන් සංශෝධනය කරන ලදී.

*ලියාපදිංචි මුදල් සමාගම් විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු මත ගෙවිය හැකි පොලී අනුපාත උපරිම සීමාව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සංශෝධනය කරන ලදී. මෙම සංශෝධනය සිදු කිරීමේදී, අඩුවෙමින් පවතින වෙළෙඳපොළ පොලී අනුපාතයන් සහ මුදල් සමාගම් මුහුණ පා ඇති ද්‍රවශීලතා ගැටළුව ගැන මුදල් මණ්ඩලය විසින් සැළකිල්ලට ලක් කරනු ලැබිණ. එමෙන්ම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් මුදල් සමාගම්වල පවත්වාගෙන යන තැන්පතු සඳහා විශේෂ පොලී ප්‍රතිශතයක් ගෙවීමට ඇති හැකියාවද සැලකිල්ලට භාජනය කරන ලද අතර, ඒ තුළින්, මෙම අරමුදල් දිගුකාලීන ආයෝජන අරමුණු සඳහා යොදා ගැනීමට හැකියාව ලැබෙන අතර, පොලී අනුපාතයන් අඩුවීමෙන්, ආදායම් ඉපයීමේ අපේක්ෂාවෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් ලියාපදිංචි මුදල් සමාගම්වල ආයෝජනය කර ඇති තම විශ්‍රාමික පාරිතෝෂිත සහ අනෙකුත් දිගුකාලීන ඉතිරිකිරීම්වල ඉපයීම්වලට ඇතිවන*

2010 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කර ඇති සංශෝධිත විධානයට අනුව, මාස 12 ක් හෝ ඊට අඩු කල් පිරීමේ කාලයකින් යුක්ත වන කෙටි කාලීන තැන්පතු සඳහා අදාළ කාර්තුවට ආසන්නතම පූර්ව කාර්තුව තුළදී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සාමාන්‍ය ඵලදාවට අමතර ප්‍රතිශත අංක හතරක් (4) එකතු කර ගෙවීමට මුදල් සමාගම්වලට හැකිය. මාස 12 ට වඩා වැඩි කල් පිරීමේ කාලයකින් යුත් තැන්පතු සඳහා, අදාළ කාර්තුවට ආසන්නතම පූර්ව කාර්තුව තුළ නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදාවට අමතර ප්‍රතිශත අංක පහක් (5) එකතු කර ගෙවීමට මුදල් සමාගම්වලට හැකිවනු ඇත. එමෙන්ම, සාමාන්‍ය ඉතිරිකිරීමේ තැන්පතු සඳහා මුදල් සමාගම්වලට අදාළ කාර්තුවට ආසන්නතම කාර්තුව තුළ දී නිකුත් කරන ලද දින 91 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදා අගය නොඉක්මවන පරිදි ගෙවිය හැකිය.

2010 ජනවාරි 01 දිනෙන් පසුව වයස අවුරුදු හැටකට (60) වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියකු විසින් පවත්වාගෙන යනු ලබන ඉතිරිකිරීමේ හෝ කාලීන තැන්පතු සඳහා එම තැන්පතු භාර ගැනීමේදී හෝ අළුත් කිරීමේදී, ඉහත සඳහන් කරන පොලී අනුපාතයන්ට අමතරව ප්‍රතිශත අංක හයක් වැඩියෙන් ගෙවීමට මුදල් සමාගම්වලට හැකිවනු ඇත.

## 3. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2010 ජනවාරි


*2009 දෙසැම්බර් මස වන විට, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 3.4 දක්වා අඛණ්ඩව අඩු වූ අතර, කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (පාදක වර්ෂය = 2002) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය සියයට 4.8 දක්වා වැඩි විය. ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ ජාත්‍යන්තර වෙළෙඳ ද්‍රව්‍ය මිල ගණන් නැවත ඉහළ යෑම සහ මෙම වසරට සාපේක්ෂව පසුගිය වසරෙහි උද්ධමනයෙහි පැවති අඩු මට්ටම් යනාදී කරුණු හේතුවෙන් උද්ධමනයෙහි ක්‍රමික වැඩිවීම අපේක්ෂා කර තිබුණි. කෙසේ නමුත් 2010 සඳහා උද්ධමන පුරෝකථන තුළින් උද්ධමන පීඩන අඩු මට්ටමක පවතින බව පෙන්නුම් කරන අතර, මෙය වසර අවසානය වනවිට උද්ධමනය තනි අංකයක පැවතීමට ඉවහල් වනු ඇත.*


උද්ධමනයේ යහපත් ඉදිරි දැක්ම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව 2009 වසර තුළ සිය මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කරන ලදී. මෑත සතිවලදී කෙටිකාලීන මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්හි යම් විචලනයක් පෙන්නුම් කළද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින්, 2009 අවසානය වනවිට වෙළෙඳපොළ පොලී අනුපාතික අඩු මට්ටම්වලට පහත වැටී ඇත. මේ හේතුවෙන් 2009 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා අඛණ්ඩව සංකෝචනය වූ පෞද්ගලික අංශයට ලබාදෙන ණය නොවැම්බර් මස තුළ නාමික වශයෙන් වැඩි විය. ඉදිරි කාලය තුළ දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනයත් සමඟ මෙම වැඩි දියුණුවීම තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.මෙකී වර්ධනයන් සැළකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය විසින් 2010 ජනවාරි 18 වැනි දින පැවති රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති විවරණය 2010 පෙබරවාරි 16 වැනි දින ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

## 4. 2009 නොවැම්බර් මාසයේ විදේශ වෙළෙඳමේ ක්‍රියාකාරිත්වය

*2009 නොවැම්බර් මාසයේදී වෙළෙඳ ශේෂය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 251 දක්වා සියයට 24.4 කින් එකොළොස් වන වතාවටත් අඛණ්ඩව අඩු වූ අතර මේ සඳහා මූලික වශයෙන්ම හේතු වූයේ ගෝලීය ආර්ථික අර්බුදයෙන් ඇති වූ බලපෑමයි. අපනයන ආදායම සියයට 5.0 කින් පහත වැටීම සහ ආනයන වියදම සියයට 11.6 කින් පහත වැටීම මෙමඟින් පිළිබිඹු කරයි. පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදය සමඟ සසඳන විට 2009 පළමු මාස එකොළහ තුළදී අපනයන ආදායම සහ ආනයන වියදම පිළිවෙලින් සියයට 14.7 ක් සහ 31.9 ක් බැගින් පහත වැටුණි. ඒ අනුව, 2008 පළමු මාස එකොළහ තුළදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,503 ක් වූ සමුච්චිත වෙළෙඳ ශේෂය 2009 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,468 දක්වා සියයට 55.1 කින් පහත වැටුණි.*




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයනයන් ධනාත්මක වර්ධනයන් පෙන්නුම් කළද, කාර්මික අපනයන පහත වැටීම හේතුවෙන්, 2009 නොවැම්බර් මාසයේදී අපනයන ආදායම පහත වැටුණි. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන විට කෘෂිකාර්මික අපනයන 2009 නොවැම්බර් මාසයේදී අඛණ්ඩව දෙවන වතාවටත් යහපත් වර්ධනයක් වාර්තා කළ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ තේ අපනයනයයි.

පාරිභෝගික භාණ්ඩ ආනයනවල ධනාත්මක වර්ධනය හේතුකොටගෙන 2009 නොවැම්බර් මාසයේදී ආනයන වියදම සාපේක්ෂව අඩු අගයකින් පහත වැටුණි. ආහාර ද්‍රව්‍ය ආනයනය ඉහළයාම හේතුවෙන් 2009 නොවැම්බර් මාසයේදී පාරිභෝගික භාණ්ඩ ආනයනයන් ආන්තික වශයෙන් වර්ධනය විය. කෙසේ වුවත්, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පෙර මාසවලදී මෙන්ම පහත වැටුණු අතර, මේ සඳහා මූලික වූයේ මෝටර් රථ හා විදුලි උපකරණ ආනයන අඩු වීමයි. පොහොර ආනයන පරිමාව වර්ධනය වුවද, පොහොර ආනයන වියදම පහත වැටීම හේතුවෙන් 2009 නොවැම්බර් මාසයේදී අන්තර් භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන විට 2009 නොවැම්බර් මාසයේදී ආයෝජන භාණ්ඩ ආනයනවලද පහත වැටීමක් වාර්තා විය. ප්‍රවාහන උපකරණ ආනයනවල සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළද, ආයෝජන භාණ්ඩයන්ට ඇතුළත් අනෙකුත් සියළුම උපභාණ්ඩ සෘණාත්මක වර්ධනයන් වාර්තා කරන ලදී.

සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ගලාඒම වැඩිවීම හේතුවෙන්, වෙළෙඳ ගිණුමේ හිඟය සම්පූර්ණයෙන්ම සමනය විය. 2009 පළමු මාස එකොළහ තුළදී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,035 දක්වා සියයට 14.2 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, වෙළෙඳ හිඟයට වඩා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 567 ක (සියයට 23 ක පමණ) අතිරික්තයක් පෙන්නුම් කර ඇත.

2009 නොවැම්බර් මාසය අවසන් වනවිට ආසියානු නිෂ්කාශන සංගමයේ (ACU) අරමුදල් සහිතව සහ රහිතව දළ නිල සංචිත ප්‍රමාණය පිළිවෙලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,308 ක් සහ 5,228 ක් ලෙස වාර්තා විය. එ.ජ.ඩොලර් දශ ලක්ෂ 262 ක් වූ භාණ්ඩාගාර බිල්පත් මත වූ ශුද්ධ ලැබීම් ද, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,068 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර මත වූ කෙටිකාලීන ශුද්ධ ලැබීම් ද මීට ඇතුළත් වේ. පසුගිය මාස දොළහ තුළ සිදු වූ සාමාන්‍ය ආනයනයන්ට අනුව (මසකට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 823) ආසියානු නිෂ්කාශණ සංගමයේ අරමුදල් රහිත දළ නිල සංචිත ප්‍රමාණය මාස 6.4 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් විය.

මෙම කාල පරිච්ඡේදය සඳහා විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරීත්වය පහත සඳහන් සංඛ්‍යා සටහනෙන් තවදුරටත් පෙන්වා ඇත.

## විදේශ වෙළෙඳමෙහි ක්‍රියාකාරිත්වය - 2009 නොවැම්බර් සහ 2009 ජනවාරි - නොවැම්බර්

| | 2008 නොවැ. එ.ජ.ඩො. දශ ලක්ෂ | 2009 නොවැ. එ.ජ.ඩො. දශ ලක්ෂ | නොවැ. වර්ධනය (සියයට) | 2008 ජන: සිට නොවැ. එ.ජ.ඩො. දශ ලක්ෂ | 2009 ජන: සිට නොවැ. එ.ජ.ඩො. දශ ලක්ෂ | ජන: සිට නොවැ. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **645.1** | **613.0** | **-5.0** | **7,456.0** | **6,361.1** | **-14.7** |
| මෙයින් කෘෂිකාර්මික | 126.0 | 155.8 | 23.7 | 1,734.0 | 1,521.0 | -12.3 |
| මෙයින් තේ | 87.1 | 105.0 | 20.4 | 1,190.3 | 1,068.4 | -10.2 |
| කාර්මික | 512.5 | 450.0 | -12.2 | 5,603.3 | 4,757.3 | -15.1 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 287.1 | 263.9 | -8.1 | 3,095.4 | 2,930.7 | -5.3 |
| ඛනිජ ද්‍රව්‍ය | 6.7 | 7.3 | 8.8 | 118.7 | 82.8 | -30.2 |
| **ආනයන** | **977.5** | **864.2** | **-11.6** | **12,959.4** | **8,829.6** | **-31.9** |
| පාරිභෝගික භාණ්ඩ | 175.6 | 178.7 | 1.8 | 2,357.1 | 1,740.0 | -26.2 |
| මෙයින් ආහාර හා පාන වර්ග | 99.8 | 113.9 | 14.1 | 1,403.2 | 1,110.3 | -20.9 |
| මෙයින් අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 75.8 | 64.8 | -14.4 | 953.9 | 629.7 | -34.0 |
| අන්තර් භාණ්ඩ | 591.5 | 497.8 | -15.8 | 7,794.1 | 4,993.8 | -35.9 |
| මෙයින් ඛනිජ තෙල් | 150.3 | 150.0 | -0.2 | 3,173.1 | 1,847.9 | -41.8 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 143.8 | 139.3 | -3.1 | 1,557.5 | 1,308.1 | -16.0 |
| ආයෝජන භාණ්ඩ | 199.8 | 180.7 | -9.6 | 2,685.2 | 1,991.0 | -25.9 |
| මෙයින් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 83.1 | 82.2 | -1.1 | 1,194.0 | 827.9 | -30.7 |
| මෙයින් ප්‍රවාහන උපකරණ | 25.4 | 28.6 | 12.6 | 320.4 | 315.7 | -1.5 |
| මෙයින් ගොඩනැගිලි ද්‍රව්‍ය | 72.7 | 45.8 | -37.0 | 864.9 | 593.2 | -31.4 |
| **වෙළෙඳ ශේෂය** | **-332.4** | **-251.2** | **-24.4** | **-5,503.4** | **-2,468.5** | **-55.1** |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

## 5. ශ්‍රී ලංකාව මැදි ආදායම්ලාභී නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයක තත්ත්වය කරා ළගා වේ

*2010 ජනවාරි මස 11 වැනි දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) විසින් "දිළිඳුකම අඩු කිරීම හා ආර්ථික වර්ධනය සඳහා වූ අරමුදල" (Poverty Reduction and Growth Trust - PRGT) සඳහා සුදුසුකම් ලත් රටවල් ලැයිස්තුවෙන් ශ්‍රී ලංකාව උසස් කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාව මැදි ආදායම්ලාභී නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයක් පවතින රටක් ලෙස පිළිගැනේ. මෙම වර්ධනය හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය හා ප්‍රාග්ධන වෙළෙඳපොළවල්වල ශක්තිමත් ලෙස පෙනී සිටීමට ශ්‍රී ලංකාවට අවස්ථාව සැලසේ.*

රටක්, "දිළිඳුකම අඩු කිරීම හා ආර්ථික වර්ධනය සඳහා වූ අරමුදලින්" උසස් කරනු ලබන්නේ පහත සඳහන් නිර්ණායක සපුරාලන්නේ නම් පමණි.

(i) "අන්තර්ජාතික සංවර්ධන සංගමය" (IDA) මගින් නිර්දේශිත අවම මට්ටමට වඩා ඉහළ ඒක පුද්ගල ආදායම් මට්ටමක් වසර කිහිපයක් පුරා පවත්වා ගැනීමට හැකි වීම.

(ii) ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ කරා ස්ථායී හා ඉහළ ප්‍රවේශයක් ලබාගැනීමේ හැකියාව පැවතීම.

(iii) කෙටිකාලීන ඉහළ අවදානම් තත්ත්වයන්ට මුහුණ දීමට සිදු නොවීම.

ශ්‍රී ලංකාව ඉහත ලේඛනයෙන් උසස් කිරීමේදී ජා.මූ.අරමුදලේ විධායක මණ්ඩලය විසින් පහත සඳහන් විශේෂිත සාධක සැලකිල්ලට ගන්නා ලදී.

(i) මෑත වර්ෂවල වාර්තා කළ ශක්තිමත් ආර්ථික ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2008 වසරේ දී ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය, "අන්තර්ජාතික සංවර්ධන සංගමය" මගින් නිර්දේශිත මට්ටමට වඩා ඉහළ මට්ටමක් වූ එ.ජ.ඩොලර් 2,014 දක්වා ළගා වූ අතර, පසුගිය වසර 5 ක කාලපරිච්ඡේදය තුළ දී ඒක පුද්ගල දළ ජාතික ආදායම අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් නොකරන ලදී. තෙල් මිල ගණන් ඉහළයාම සහ බහු කෙදි ගිවිසුම අවසාන වීම වැනි කරුණු හේතුවෙන් හටගත් කම්පන තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීමට ඇති හැකියාව, ශක්තිමත් වර්ධන ක්‍රියාකාරිත්වය තුළින් පෙන්නුම් කොට ඇත.

(ii) ගෝලීය අර්බුදයේ බලපෑම් අවම කිරීම සඳහා 2009 ජූලි මාසයේ දී ජා.මූ.අරමුදලෙන් සම්පස්ථ ණය පහසුකමක් ලබාගැනීම. තවද, අපනයන යථා තත්ත්වයට පත් වීමේ සළකුණු පෙන්වන අතරතුර, 2010 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය, පූර්ව-අර්බුද සමයේ පැවති මට්ටම කරා පැමිණෙතැයි අපේක්ෂා කිරීම හේතුවෙන්, සම්පස්ථ ණය පහසුකම් වැඩසටහන යටතේ ආර්ථික ප්‍රගතිය අපේක්ෂිත මට්ටමටත් වඩා ශක්තිමත් වී ඇත.

(iii) රජයේ විදේශීය ණය බර මධ්‍යකාලීනව ක්‍රමිකව අඩු වනු ඇතැයි පුරෝකථනය කර තිබීම. රුපියල අවප්‍රමාණය වීමට සහ විදේශීය කම්පනයන්ට ණය ගතික දර්ශක සංවේදීභාවයක් පෙන්වුවද, රාජ්‍ය ණය ස්ථාවර මට්ටමක පවත්වාගැනීම සහතික කිරීම සඳහා සම්පස්ථ ණය පහසුකම් වැඩ සටහන මගින් බලාපොරොත්තු වූ පරිදි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයන් කලානුරූපීව ක්‍රියාවට නැංවීම වැදගත් වනු ඇත.

(iv) පසුගිය වර්ෂයන් තුළදී අන්තර් ජාතික ප්‍රාග්ධන වෙළෙඳපොළවලට ප්‍රවේශ වීමට සහ එම වෙළෙඳපොළ පිවිසුම් නිර්ණායකයන් කරා එළඹීමට ශ්‍රී ලංකාවට පැවති හැකියාව. මෑත දී නිකුත් කළ පස් අවුරුදු ස්වෛරීත්ව බැඳුම්කර සඳහා වූ අධි ඉල්ලුම තුළින්, ජා.මූ.අරමුදලේ අනුග්‍රහයෙන් දියත් කළ වැඩසටහන යටතේ ලද ප්‍රගතිය මෙන්ම අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළෙඳපොළවලට අඛණ්ඩව ප්‍රවේශ වීමට ඇති හැකියාව මනාව පිළිඹිබු විය.

## 6. "පිබිදෙන උතුර" සහ "නැගෙනහිර සංවර්ධන" ණය යෝජනා ක්‍රමයන්හි පොලී අනුපාතිකය සියයට 9 දක්වා පහත හෙලීම

*ආදායම් උත්පාදන වැඩි දියුණු කිරීම් ඉලක්කකොටගෙන උතුරු සහ නැගෙනහිර පළාත් සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම දෙකෙහි ණය ලබාදීමේ පොලී අනුපාතික, සියයට 12 සිට සියයට 9 දක්වා, 2010 ජනවාරි 1 වන දින සිට අඩු කරනු ලැබ ඇත.*

කෘෂිකර්මය, පශු සම්පත්, ධීවර සහ ක්ෂුද්‍ර සහ සුළු ව්‍යවසායයන්හි ආර්ථික කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රාග්ධන ආයෝජන සඳහා ණය පහසුකම් සපයා දීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උතුරු පළාත සඳහා "පිබිදෙන උතුර" සහ නැගෙනහිර පළාත සඳහා "නැගෙනහිර සංවර්ධන" යන විශේෂ ණය යෝජනා ක්‍රම දෙකක් හඳුන්වා දෙන ලදී. පිබිදෙන උතුර සහ නැගෙනහිර සංවර්ධන යන ණය යෝජනා ක්‍රම දෙක සඳහා උපරිම ණය සීමාව පිළිවෙලින් රු. 200,000 ක් සහ රු. 250,000 ක් වනු ඇත. ණය ගෙවීමේ කාල සීමාව, මාස හයක සහන කාලයක් සමඟ අවුරුදු 5 කි.

මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස පහත සඳහන් මූල්‍ය ආයතන හඳුනාගෙන ඇත.

- ලංකා බැංකුව
- මහජන බැංකුව
- කොමර්ෂල් බැංකුව
- සම්පත් බැංකුව
- ඩී.එෆ්.සී.සී. බැංකුව
- සණස සංවර්ධන බැංකුව
- හැටන් නැෂනල් බැංකුව
- සෙලාන් බැංකුව

## 7. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2008, 2009 සහ 2010

(2002 = 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 |
| ජනවාරි | 183.5 | 203.1 | 216.4 | 3.0 | -0.3 | 1.4 | 20.8 | 10.7 | 6.5 | 16.4 | 21.6 | 3.1 |
| පෙබරවාරි | 188.6 | 202.9 | | 2.8 | -0.1 | | 21.6 | 7.6 | | 17.0 | 20.3 | |
| මාර්තු | 191.9 | 202.0 | | 1.7 | -0.4 | | 23.8 | 5.3 | | 17.7 | 18.6 | |
| අප්‍රේල් | 195.4 | 201.0 | | 1.8 | -0.5 | | 25.0 | 2.9 | | 18.7 | 16.7 | |
| මැයි | 198.5 | 205.1 | | 1.6 | 2.0 | | 26.2 | 3.3 | | 19.8 | 14.7 | |
| ජුනි | 205.9 | 207.8 | | 3.7 | 1.3 | | 28.2 | 0.9 | | 21.0 | 12.5 | |
| ජූලි | 206.4 | 208.7 | | 0.2 | 0.4 | | 26.6 | 1.1 | | 21.9 | 10.4 | |
| අගෝස්තු | 206.3 | 208.1 | | 0.0 | -0.3 | | 24.9 | 0.9 | | 22.6 | 8.5 | |
| සැප්තැම්බර් | 207.2 | 208.6 | | 0.4 | 0.2 | | 24.3 | 0.7 | | 23.2 | 6.6 | |
| ඔක්තෝබර් | 206.6 | 209.4 | | -0.3 | -0.4 | | 20.2 | 1.4 | | 23.4 | 5.2 | |
| නොවැම්බර් | 205.2 | 211.0 | | -0.7 | -0.8 | | 16.3 | 2.8 | | 23.0 | 4.1 | |
| දෙසැම්බර් | 203.7 | 213.5 | | -0.7 | 1.2 | | 14.4 | 4.8 | | 22.6 | 3.4 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව